




## වෙස්මුණ ගලවමු ලූෂන්

# ලූෂන් බුලත්සිංහල නම්වූ අපේ කාලයේ පුංචි කාලිදාස

අහමඩ් එක්ක ඉස්කෝලේ ඇරිලා, එන්න මං කැමති නෑ. එකාගේ කටේ දිගට හරහට උරන සුරුට්ටුව. හැබැයි මම ඒකට ආසයි අපේ තාත්තාගේ ඔපීසියේ වැඩ කල බුද්ධක පුත්‍රගෙන් අඩුවෙන් ප්‍රශ්න අහපු සුන්දර ඉස්ලාම් භක්තිකයා. අහමඩ් නෝ කතා නෝ සිනා. සතොස කියන්නේ ඒ කාලේ අද තියෙන සුපර්මාර්කට් තරම් වර්ණ ගැන්වූ නැති වුනත් මිනිසුන්ට කන්න බොන්න හරි දේ හොද දේ පහසු මිලට තිබ්බ තැන. රාසික් සරුක් කියලා මුස්ලිම් උස මහත ලොක්කෙක් තමයි ඒ දවස්වල සභාපති.

සේවය ඉරහද සේ සලකාලමු ලක් ජන
වැඩට අපේ
භේද කිසිත් නැති සේ සම සේවය වේ අප
සිතට සැපේ.
පිනවමු ගුණ සමුදා අපි මිහිරෙන්
සතොස සදා
භේද කිසිත් නැති සේ සම සේවය
වේ අප සිතට සැපේ

අපේ තාත්තා ද ආර්.ආර් අංකල් (නැසීගිය ආර්. ආර්. සමරකෝන් ශූරින්), කඩුවෙල පැත්තේ ප්‍රාදේශීය සභාවක ලොක්කෙක් වන බුද්ධදාස උන්නැහේ මෙන්ම මර්වින් සිල්වාද ආදරණීය අනුලා ඇන්ටිද අපේ තාත්තා වටා ගැවසුණු සුන්දර චරිත වේ. සතොස කියන්නේ සමුපකාර තොග වෙළද සංස්ථාවයි. අනුලා ඇන්ටි වැඩ කලේ තාත්තාගේ ඒ ළඟම මේසයේ ය. කාලය අතීතයට දිවයයි, නත්තල් දිනට පසු දිනක අපෙන් සදහටම වෙන්ව ජීවමානාවූ තාත්තා බුද්ධක දිහා බලා හිනැහෙයි. මට තත් තත් තාර පැටියා ..මතක් වෙයි.

මේ ගඟ මේ දුරු කතර ගෙවා
ඇයි මෙතනින් සයුරේ වැටුනේ
මේ හැටි දුර පියමන් කරලා
ඇයි මම නුබ ලග නතර උනේ..

අනුලා ඇන්ටිත්, ලූෂන් අංකල් ගාව නතර වුනේ ඇයි කියලා මං දන්නේ නෑ. හැබැයි ඒත් අපි කවුරුත් මිනිස්සු. සර්ව සම්පූර්ණත් වයක් අප කිසිවෙකු තුල නෑ. ඔබේ හෘද සාක්ෂියට ඔබ නිවැරදි වන ඇතැම් අවස්ථා වල සමාජයට ඔබ වැරදි වන්නට හැකියි. සමාජයට ඔබ නිවැරදි වෙන අවස්ථා වල ඔබේ ආත්මයටම සිදු කර ගන්නට හැකි විශාලතම වරද ඔබ විසින්ම සිදු කරගෙන තිබෙන්නටද හැකියි. "මේ ගඟ මේ දුරු කතර ගෙවා" ගීතය තුල ලූෂන් බුලත්සිංහලයන් ගෙනහැර දක්වන්නේද අපට කියා පාන්නේ යම් ජීවිතයක තවත් එක් සුන්දර කතාවක් නොවේද.

## ඔය වෙස්මුණ ගලවමු ලූෂන්



දීකිරි දීකිරි ගෙනවා දීකිරි මිහිපිට කාටත්
ගුණදෙන දීකිරි
පැටියා මෝරපු දෙනගෙන් රාන්කිරි
හොඳහැටි උණුකර බීවා රන් කිරි
නැවුම් මුට්ටියේ වත්කළ මේ කිරි පණමට
ලාබයි මං දෙන දී කිරි

ලූෂන් බුලත්සිංහල රචනා කළ රතුහැට්ටකාරී වේදිකා නාට්‍යය 1974 රාජ්‍ය නාට්‍ය උළෙල නියෝජනය කරමින් හොඳම රචනය, හොඳම සංගීත අධ්‍යක්ෂණය සඳහා වන රාජ්‍ය සම්මානද, රඟපෑම් සඳහා විශිෂ්ට කුසලතා සම්මාන ද්විත්වයක්ද දිනාගත් නාට්‍යයකි. රචනය වෙනුවෙන් ලූෂන් බුලත්සිංහල සංගීත අධ්‍යක්ෂණය වෙනුවෙන් ඔස්ටින් මුණසිංහ ද රඟපෑම් කුසලතා සම්මාන සඳහා අනුලා බුලත්සිංහල හා ජය ශ්‍රී චන්ද්‍රජිත් ද සම්මා නලාභීහු වූහ. හැබැයි 1974 සියලූ රාජ්‍ය සම්මානවලට හිමිකම් කී රතුහැට්ටකාරී වේදිකා නාට්‍යයට ලහොදම නාට්‍ය ලෙස සම්මාන නොදීමෙන් මුට්ටිය බිද ගත් අයගේ චරිත වලට පණ දෙන රාජ්‍ය සේවක පොඩියන්ලා අදද හිග නැත.

ඔස්ටින් මුණසිංහ ද මානව හිතවාදී කපුගේ ද අවස්ථා දෙකේ ලූෂන්ට නොමසුරුව අතහිත සපයයි.

විදුලි මිනි පහන් දැවී ..බොළඳ ගී සිනා රැලි
නිලංකාර අඳුරේ සිරවී සැදෑ සාදයේ

දෙන්න කන්න බොන්න නොකියා
දෙනෙතින් ආරාධනා
දෑත පා ඉඳුල් යදි ඇස් ගයා හංස ගීතිකා

පන්ති පරතරය පිළිබඳව වඩා උචිත ආකාරයෙන් ගීයක් තුලින් ජනතාව ඇමතීමට ලූෂන් කපුගේ සුසංයෝගය උත්සහ ගත්තේ එසේය. ප්‍රේමයේ සුන්දර අසුන්දර අනුභූතීන් තුල කොටුවී සිටි පරම රසික දනන් හට, ඕලාරික මනෝ ලෝකතුලින් පියවි ලෝකයට රැගෙන ඒමටත් ,ජනතාවාදී නැඹුරුවකින් ඔවුන් මෙහෙය වීමටත් කපුගේ සමත් විය. මට මගේ ජිවිතයේ හමුවන ප්‍රබුද්ධ ලූෂන් බුලත්සිංහල ය.

සිංහල වේදිකා නාට්‍ය සඳහා බොහෝ අවස්ථාවල ශෛලිගත හෝ සංගීතමය නාට්‍ය සඳහා ගීත ඇතුළත්ව තිබෙනු අපට පෙනේ. මෙය දශක ගණනක හැදෑරීම තුල හොදින් ප්‍රත්‍යක්ෂ වේ. එහෙත් වේදිකා නාට්‍යයෙන් බැහැරව ගෙන රසවිඳීමේ ගීතමය ගුණයෙන් යුතු නිර්මාණ අල්පය. වාණිජව එසේ සාර්ථකවූ නාට්‍ය ඉතා අල්පය. මහාචාර්ය සරච්චන්ද්‍රගේ ශෛලිගත සම්ප්‍රදායෙන් නිෂ්පාදිත, මනමේ, සිංහබාහු, පෙමතෝ වැනි නාට්‍යයක හෝ දයානන්ද ගුණවර්ධනගේ නරිබෑනා, ගජමන් පුවත, ජසයා හා ලෙන්චිනා, මධුර ජවනිකා හෝ ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන වැනි නාට්‍යකරුවකුගේ අර්ධ ශෛලිගත නාට්‍යයක හෝ එන ගීත හැරුන කල ජනප්‍රිය වේදිකා නාට්‍ය අතර, නව නාට්‍යක රුවන්ගේ ගීතවේ නම් එහි ප්‍රමුඛයා වන්නේ අපේ ලූෂන් බුලත්සිංහල යයි මම දැඩිව විශ් වාස කරමි. රතුහැට්ටකාරී මෙන්ම තාරාවෝ ඉගිලෙති ද එවන් ගුණයෙන් යුතු නාට්‍ය වේ.

හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පනමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මුට්ටිය/ බිඳුණොත් ඔක්කොම ඉවරයි....

"පුතේ තව යෝගට් එකක් කමු ද?" අනුලා ඇන්ටි අසයි. දිව බෑ කියන්නේ නැති වග බුද්ධක හිස වන වනා ඇයට කියයි. රතුහැට්ටකාරියගේ භූමිකාව රඟපාමින් මෙම ගීතය ගයන ලද්දී ප්‍රතිභාන්විත රංගධාරිණියක හා ගායිකාවක වන අනුලා බුලත්සිංහල හෙවත් අපේ තාත්තාගේ ඔපීසි මිතුරිය වූ අනුලා ඇන්ටි විසිනි.

දිළිඳු කම බොහෝ දෙනෙකුට බලපාන්නා වූ පොදු ප්‍රශ්නයකි. අවාසනාවකට සමහරුන් එයින් ඉතාම තදින් බැට කති. දුක් විඳිති. පවුල් සමාජ පතුල, දිළිඳු කමේ ද නැතිනම් දිළිඳු කමේ පතුලේම, පවුල් සමාජ ගිලී සිටින්නේද යන්න ප්‍රශ්නාර්ථයකි. අප සමාජ ප්‍රජාවේ මවු වරු සහ දරුවෝ එහි උග්‍ර පල විඳිති.

පුංචි පැටික්කන් මග දිග හ□වන
සිල්ලර රස කැව්ලි
දුව යන ඉගිලෙන විසිතුරු සෙල්ලම්
යානා පෙනී පෙනී
අහක බලා ගෙන මග දිග යන විට
නෑ මට වාවන්නේ
හීනෙන් හිනා නොවී
මා හඬවාපන් මේ රෑ යාමේ

මේ දරුවා ඉතා කීකරු දරුවෙකි. කුඩා වුවද නැති බැරිකම් ගැන ඔහුට හොඳ අවබෝධයක් ඇත්තෙම නැත. මා ඒ දරුවා යැයි බුද්ධකට සීතේ. මග දිගට ඇති රස කැව්ලි, සෙල්ලම් බඩු වලට ආශාව මා තුල තිබුනත් ආසාව ඇතත් ඒ දෙස වත් නොබලමින් පාසල් ගියේ එහෙයිනි. අළුත් ඇඳුම් ඉල්වමින් තම මවට කරදර කලේද නැත. වැරහැලි ඇඳගෙනම සිටී. විලි වසා ගැනීමට කොල අතුද හිගය. මොකද දැන් එළුවෝද තාප්පවල පෝස්ටර උලා කති. අසල ළමයි ආසාව ලෙව කති. ගෙදර ලිප මෙළවෙන්නේ ඉඳහිටය. එහි පිසින්නේත් සුණු සහල් කැඳය. නමුත් එය රස කරමින් පානය කරයි. ඉන් නොනැවති, ඔහු නොදුටු සැප සම්පත් නොපතා හීනෙන් පවා සිනාසෙයි. අපිත් බොහෝ වෙලාවට හොදට හිනාවෙන්නේ සිහිනෙනි, පියවි සිහියෙන් හද වතින් ඉන්න මිනිස්සු ඉන්නවා නම් ලෝකය කොච්චර ලස්සනද.

නැත්නම් මේ තම පුතු ඉපිද ඇත්තේ අතු පැලකය. නිකම්ම පොල් අතු පැලක නොව සුළඟට ගසා ගෙන යන පොල් අතු සහිත, හිරිකඩ ගසන, අබලන් පොල් අතු පැලකය. ඔහු රජ මැදුරක ඉපිද සිටියා නම් ඔහු රජ වන්නට පවා හැකිවනුයේ ඔහු දිරිය දරුවකු නිසාය. එවන් දරුවකුට මීට වඩා සැප සම්පත් නොදීමට හැකි වීම ගැන මව සොවින් තැවේ. හීනෙන් සිනා නොවී මව හ□වන් නට කියන්නේ එබැවිනි. ලූෂන් අංකල් මට වටින්නේ ඔහු වඩාත් සියුම්ව මේ ප්‍රස්තුතය එහි අරුත් කුළු ගැන්වෙන අන්දම මනාව දැකිය හැකි අයුරින් පෙළ ගස්වයි. රස කැව්ලි ලසිල්ලරල ය. එත් ලූෂන්, දරුවා සමාජයේ පුහු ආටෝපයන් කෙරෙන් ඉවත බලා යන්නෙක් බවත් රජකමට ඔහු සුදුසු වන්නේ එබැවින් බව කියන්නෙත් අවංකය. පාලකයන්ට රස කැව්ලි ලතොගයල ය. පොරොන්දු මෙන්ම දෙඩිල්ල තොග වලින්ය. අවසානයේ මාළු , පාන්වලද, පාන්වල මාළුද නැත. තවමත් පිටිවල ගුල්ලෝ ඇතිබව බුද්ධකගේ වැලමිටට දැනේ. ලොක්කන්ගේ අම්මලා නිතර මතක් කරන සමාජයක් මුළු ගීය පුරාම පියා ගැන වදනකදු ඉගි



නොමරන්නට ප්‍රවේසම් වෙයි. උප්පැන්නේ ද පියා ලොප් වී ඇති බව හෙමිහින් කියයි. මේ දරුවා අවජාතක දරුවකුදෝ යන සැකය බුද්ධකගේ බොටුව තුල ජනිත කරවා හිර කරයි. ලූෂන් බුලත්සිංහල යනු කවදත් විප්ලවීය පද ගීයට ගෙන ආ රචකයෙකි.

රජ මැදුරක ඉපදී සිටියා නම් ඔය වෙස්මුණ ගලවමු ලූෂන්

දවසක් පාසලේ මල් වර්ගයක් පිළිබද අසනු ලැබූ ප්‍රශ්නයකි. බුද්ධකගේ කීට මොලයට අනුව උත්තරය ලනාරිලතා මල්ය. පිපුනේ යටලීයේය. ලියලා තිබුනේ ලූෂන් අංකල් ය. අමරදේවට දෙන්න තිබ්බ ගීතය කියලා තිබුනේ එඩ්වඩ් අයියාය. කණ පුපුරන්න

35 වන පිටට